වෛද්‍ය විද්‍යාව

# සතුන් යොදා කළ පර්යේෂණවලින්

**ගෙවුණු සියවස පුරා, වෛද්‍ය ක්ෂේත්‍රයේ සිදු කළ අත්හදා බැලීම් / පර්යේෂණ බොහෝමයක් ම සතුන් යොදා ගනිමින් සිදු කෙරිණි. තවත් මෙවැනිම අත්හදා බැලීම් රැසක් පර්යේෂණාත්මක මට්ටමේ පවතී. ගෙවුණු සියවසේ එලෙස සතුන් යොදා සිදු කරමින් සාර්ථකත්වයට පත් සොයා ගැනීම් පිළිබඳ විස්තරයකි, මේ.**

## 1900 ට පෙර

* ජලභීතිකාව සඳහා ප්‍රතිකාර

නිවසේ සුරතලයට ඇතිකරන සතුන් මගින් හෝ කැලෑ සතුන් මගින් මිනිසාට බෝ වේ. මාරාන්තික රෝගයකි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්, හාවුන්

* වසූරිය සඳහා ප්‍රතිකාර

අතීතයේ ලොව පුරා පැතිරුණු දරුණුතම වසංගත රෝගයකි. වාර්තා වන අන්දමට ලොව පුරා මිලියන දෙකක් පමණ මිය ගොස් ඇත.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- එළදෙනුන්

* ඇන්ත්‍රැක්ස් සඳහා ප්‍රතිකාර

20 වැනි සියවස දක්වා ම මෙහි ව්‍යසනකාරී වසංගත තත්ත්ව වාර්තා වී ඇත. (වත්මන් ලෝකයේ ත්‍රස්තවාදීන් විසින් ඇන්ත්‍රැක්ස් රෝග බීජ, ඇමරිකාවට එරෙහිව ජීවී අවියක් ලෙස භාවිතයට ගැනීම නිසා ලොව පුරා ඇන්ත්‍රැක්ස් භීතිකාවක් පැතිර ගොස් තිබේ.) දේහ උෂ්ණත්වය ඉහළ යාම, විෂාදය (අසහනය), ගැස්ම, ශ්වසන පද්ධතිය හෝ හෘදය ආපදාවට ලක්වීම වැනි රෝග ලක්ෂණ පෙන්වන මාරාන්තික රෝගයකි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බැටළුවන්

## 1900 සිට

* හෘද කැතීටරකරණ තාක්ෂණය

ධමනි හෝ ශිරා ඔස්සේ හෘදය තුළට තැමෙන සුළු බටයක් ඇතුළු කරවීම මගින් රෝග විනිශ්චයට වෛද්‍යවරුන්ට අවකාශ ලබා දුන්නේ මෙම තාක්ෂණය මගිනි. එම බටය ඔස්සේ හෘදය තුළට සෘජුව ම ඖෂධ එන්නත් කර එමගින් රුධිර ප්‍රවාහය සහ පීඩනය මැනීමත්, උපතින් උරුම වූ හෘද රෝග සහ හෘද වාහිනී අවහිරවීම හඳුනා ගැනීම හා ප්‍රතිකාර කිරීමත් සිදු කෙරේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්, හාවුන්

* "රිකට්සියාව" සඳහා ප්‍රතිකාර

විටමින් 'ඩී' ඌනතාව නිසා කුඩා ළදරුවන්ගේ හා ළමයින්ගේ අස්ථිවල වර්ධනයේ ඇතිවන අසම්පූර්ණතාවකි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්

## 1920 සිට

* ඉන්සියුලින් සොයා ගැනීම

අග්න්‍යාශයේ ඇතිවන නිදන්ගත රෝග තත්ත්වයක් වන 'දියවැඩියාව' පාලනය සඳහා අද භාවිත වන ඔසුව මෙය යි.

කාබෝහයිඩ්‍රේට ප්‍රයෝජනයට ගත නොහැකිවීම, රුධිරයේ සහ මුත්‍රාවල සීනි ප්‍රමාණය වැඩිවීම, අධික තිබහ සහ මුත්‍රා පහවීම වැඩිවීම, දියවැඩියා රෝග ලක්ෂණ ය. ශරීරය දුර්වලවීම, සිහින්වීම සහ අවසානයේ අන්ධභාවය හෝ මරණය සිදුවීමට ද පුළුවන.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්

## 1930 සිට

* නූතන 'නිර්වින්දක' වැඩි දියුණු කිරීම

මේවා මගින් කෘත්‍රිම ලෙස සිහි නැතිකරවීමට සැලැස්වීම සහ ස්ථානීය නිර්වින්දනය හෝ වේදනා සඳහා සාමාන්‍ය අසංවේදනීයතාව ඇති කරවයි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්

* පිටගැස්ම වැළැක්වීම

මිනිසා සහ අනෙකුත් සතුන්ට ඇතිවන තීව්‍ර(Acute)ආසාදිත රෝගයකි. මාංශපේශීවල වේදනාකාරී ගැස්ම සහ වලිප්පුව වැනි තත්ත්වයක් ඇති වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- අශ්වයන්

* 'ප්‍රතිකැටිකාරක' වැඩි දියුණු කිරීම

රුධිර කැටි ඇතිවීම වළකාලන ඔසුවකි. මෙහි පමණ ඉක්මවීම නිසා කැටි ඇතිවීම, ශිරා බිත්ති ඉදිමීම සහ ඇහිරීම මගින් මරණය පවා සිදුවිය හැකි ය.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බළලුන්

## 1940 සිට

* 'රූමටික ආතරයිටිස්' සඳහා ප්‍රතිකාර

ශරීරයේ සම්බන්ධක පටක ඉදිමීමෙන් ඇතිවන රෝගී තත්ත්වයකි. ඖෂධ මගින් වේදනාවට සහනයක් ලබා දෙන අතරම ඉදිමුම පාලනය කළ ද මෙහි හේතු කාරකය තවමත් හෙළි වී නැත.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- හාවන්, වඳුරන්

* රීසස් (RH) සාධකය හඳුනා ගැනීම

රතු රුධිරාණු තුළ රීසස් ප්‍රතිදේහජනක අනාවරණය කරගත හැකිවීම මගින්, ගර්භනී සමයේ රෝග නිරෝධනය පිළිබඳ දැවැන්ත ඉදිරි පියවරක් සනිටුහන් කෙරිණි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- රීසස් වඳුරන්

* ගලපටලය (ඩිප්තීරියාව) වැළැක්වීම

උගුරේ ආවරණීත පටලයේ සහ ශ්වසන නාළවල ඇතිවන තීව්‍ර(Acute)බෝවන රෝග තත්ත්වයකි. හුස්ම ගැනීමේ අපහසුව, තද උණ, දුර්වලවීම සහ බොහෝවිට මරණය ද සිදු වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- අශ්වයන්

* ප්‍රතිජීවක වැඩිදියුණු කිරීම

පෙනිසිලින් ඇතුළු සෙසු ප්‍රතිජීවකවල වැඩිදියුණුව, මිනිසා සහ අනෙකුත් සතුන් තුළ බැක්ටීරියා ආසාදිත තත්ත්වයන් සඳහා වන ප්‍රතිකාරවල විප්ලවයක් ඇති කරවීමට සමත් විය.






# ලද වෛද්‍ය විද්‍යාවේ විජයග්‍රහණ

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- මීයන් විශේෂ, හාවුන්

*** කක්කල් කැස්ස සඳහා ප්‍රතිකාර**

ළමයින් අතර සුලබ ආසාදනයකි. ඉක්මනින් පැතිර යන ශ්වසන පද්ධතිය හා සම්බන්ධිත රෝගයකි. කෙටි, වියළි කැස්ස මූලික රෝග ලක්ෂණ වේ. බරපතල අවස්ථාවලදී වලිප්පුව සහ මොළයට හානිවීම සිදු වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- ගිනි හාවුන්, හාවුන්

## 1950 සිට

*** පෝලියෝ වැළැක්වීම**

සුළු ආසාදිත මට්ටමක සිට අංශබාග තත්ත්වය දක්වා රෝග ලක්ෂණ පෙන්වයි. අද ලොව බොහෝ රටවලින් මෙම රෝගය තුරන් කර ඇත. අනාගතයේදී මුළු ලොවෙන් ම තුරන් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- හාවන්, වඳුරන්, කෘන්තකයන්

*** DNA හඳුනා ගැනීම**

පුද්ගලයන්ගේ ප්‍රවේණි සාධකය මෙයයි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- මීයන් වර්ග

*** විවෘත හදවත් සැත්කම් සහ හෘද ගතිකරය වැඩිදියුණු කිරීම**

දරුණු හෘදයාබාධවලින් පෙළෙන්නන් සඳහා වූ විප්ලවකාරී ප්‍රතිකර්ම ක්‍රමයකි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්

*** පිළිකා රසායනික චිකිත්සාව වැඩිදියුණු කිරීම**

පිළිකාවක ඇති අවදානම අඩු කිරීම මේ මගින් සිදු වේ. එය කෙටිකාලීන හෝ ස්ථිර සුවයක් වීමට පුළුවන.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- වඳුරන්, හාවන්, කෘන්තකයන්

*** නිර්වින්දක (Tranquilizer) හඳුනා ගැනීම**

අධි ක්‍රියාකාරී බව, නොසන්සුන්තාව සහ ආතතිය අඩුකරන රසායනිකයකි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- මීයන් වර්ග, හාවුන්, වඳුරන්

## 1960 සිට

*** 'ලිතියම්' වැඩිදියුණු කිරීම**

උන්මාදිත බව, නැවත නැවතත් ඇතිවන විෂාදිය වැළැක්වීමට භාවිත වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- මීයන් වර්ග, ගිනි හාවුන්

*** ජර්මන් සරම්ප (රුබෙල්ලා) වැළැක්වීම**

වසංගතකාරී වයිරස් රෝගයකි. ලා උණ, කුෂ්ඨ ඇතිවීම වසා ග්‍රන්ථි ඉදිමීම වැනි රෝග ලක්ෂණ පෙන්වයි. ගර්භනී සමයේ වැළඳීම නිසා කළල විකෘතිතා ඇතිවීමට පුළුවන.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- වඳුරන්

## 1970 සිට

*** සරම්ප වැළැක්වීම**

බෝවන, වයිරස් රෝගයකි. ළමා වියේදී විශේෂිත ය. උණ සහ සමේ බිබිලි මතුවීම සිදු වේ. කල්ගත වූ විට මරණයට පත්වීමට ද පුළුවන.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- වඳුරන්

*** ලාදුරු සඳහා ප්‍රතිකාර**

නිදන්ගත, ආසාදිත තත්ත්වයකි. දරුණු අඩපණවීම්, සමේ වණ ඇතිවීම, පෝෂණයට බාධා වීම, තුවාල ආසාදනය නිසා ඔඩු දුවන තත්ත්වයට පත්වීම සහ අවලක්ෂණ වීම සිදු වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- වඳුරන්, ඇයන් (ආමඩිලාවන්)

*** හෘද වෛද්‍ය විද්‍යා අංශයේ ප්‍රවර්ධනය**

කිරීටක රුධිර ප්‍රවාහය මැනීම ඇතුළු හෘද කන්තුක සව්බලකරණය කිරීමේ තාක්ෂණය සහ බයිපාස් තාක්ෂණයේ ප්‍රවර්ධනය.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්

## 1980 සිට

*** අවයව බද්ධ කිරීමේ තාක්ෂණයේ ප්‍රවර්ධනය**

ශල්‍ය සහ වෛද්‍ය අංශවල උන්නතියක් සිදුවිය. එනම් ප්‍රතික්ෂේප කිරීම් වළකන ඖෂධ ආදිය සොයා ගැනීම ය.

මෙය හෘදය, අක්මාව, පෙනහළු සහ අනෙකුත් බද්ධකිරීම්වල සාර්ථකත්වයට හේතු විය.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- බල්ලන්, බැටළුවන්, එළදෙනුන්, ඌරන්

## 1990 සිට

*** 'ලැපරස්කොපි' ශල්‍ය තාක්ෂණය**

ශල්‍යකර්මයකදී, රෝගියා රෝහලේ සිටිය යුතු කාලය අවම කරවන ශල්‍ය තාක්ෂණයකි. උදපිත්තාශයේ ශල්‍යකර්මය සඳහා රෝහල්ගත වන රෝගීන්ට සැත්කමින් පසු සතියක් හෝ ඊට වැඩි කලක් රෝහල් ගත වී සිටිනවා වෙනුවට එදිනම නිවස බලා යාමේ හැකියාව ලැබේ. එලෙසම සති 4-6 ක් විවේක ගන්නවා වෙනුවට දින 2-7 අතර කාල සීමාවකදී රැකියාවට යාමේ අවස්ථාව ද උදා වේ.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- ඌරන්

*** පියයුරු පිළිකා හඳුනා ගැනීම**

පියයුරු පිළිකා සඳහා හේතුකාරක වන ජානමය හා පාරිසරික සාධක වෙන විද්‍යාඥයන් ආසන්න වෙමින් සිටී. ඇ.එ.ජ. අවු 35-54 අතර කාන්තාවන් බහුතරයක් ම මිය යන්නේ පියයුරු පිළිකා හේතුවෙනි.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- පලතුරු මැස්සා, මීයන් වර්ග

*** 'සිස්ටික් ෆයිබ්‍රෝසිස්' සඳහා ජානමය ප්‍රතිකාර**

ඇ.එ.ජ. සායනික අත්හදාබැලීම් සිදු කෙරෙමින් පවතී. මෙහිලා තබන පළමු ඉදිරි පියවර සාර්ථක වුවහොත්, එරට ළමයින් හා තරුණ පරපුර නියෝජනය කරන 30,000 ක ගේ පමණ ජීවිත අවදානමෙන් මිදෙනු ඇත. පිරිමි ළමුන්ට සහජයෙන් ඇතිවන මාංශ පේශී දුර්වලතාවක්වන "ඩුෂීන්ස් මස්කියුලර් ඩයස්ට්‍රොපි" සහ "සිකල්සෙල් ඇනීමියාව" වැනි ජානමය රෝගාබාධ සඳහා ද මෙහි ප්‍රතිඵල එක සමානව වැදගත් වනු ඇත.

පර්යේෂණයට බඳුන් කළ සත්ත්ව විශේෂ :- මීයන්, ප්‍රයිමේටාවන්

(අන්තර්ජාලය ඇසුරෙනි) - **ලලනි**







